# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,918 — 1918ක්වූ ජනවාරි මස 4වෙනි දිනවූ සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ඉඩම් විකිණීම්.

**No. 3,100, S. P.**—දකුණු දිසාවේ මහාඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 12වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ ගඟබොඩපත්තුවේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

සිතියම 9,365. ගම—ගනේගම දකුණ. අයිතිකමකියන්නා—කුමාරසිරි එන්දෙරිස් සහ තවත් අය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| H 12¼ | මිනුවන්විල | — | දෙනිය | 3 1 16 | 30 |

සිතියම 9,426. ගම—උනන්පිටිය. අයිතිකමකියන්නා—රජසන්තක.

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015 | මෝදරමුලවත්ත | ලේල්වල පදිංචි බෝකරගොඩගේ තෙපානිස් | වත්ත | 0 0 24 | 30 |
| | | | වැවිල්ල | — — | 9 |
| 2019 | හිරඑකන්දඅද්දරඹිට | එම | ඔවිට | 0 1 7 | 30 |
| | | | වැවිල්ල | — — | 4.25 |

සිතියම 9,710. ගම—වදුරඹේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| 3219 | දෙලමුල්ලේගොඩ | වදුරඹේ පදිංචි වත්තගේ තොරෙනිස් | බැද්ද | 1 0 0 | 80 |

සිතියම 9,728. ගම—කැප්පිටියාගොඩ.

| | | | | | |
|---|---|---|---|---|---|
| 3268 | දෙරනවිලගොඩබැද්ද | කැප්පිටියාගොඩ පදිංචි හේවාමානගේ ජේම්ස් | වත්ත | 0 1 14 | 35 |
| | | | වැවිල්ල | — — | 2 |

සිතියම 9,822. ගම—පානවැලිවිටිය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 3613 | කිඹුලහිටියකුඹුරේදූව | දොඩන්දූවේ මිසනාරි සමාගමේ ආර්. බී. ගුණතිලක | හේන | 0 0 32 | 30 |

සිතියම 9,937. ගම—කැරදේවල.

| | | | | | |
|---|---|---|---|---|---|
| 3991 | දෙලවත්තඅද්දරඹිට | කැරදේවල පදිංචි කේ. ඇම්. පී. චාර්ලිස් දියෙස් | ඔවිට | 0 0 8 | 40 |

සිතියම 9,953. ගම—පානවැලිවිටිය. අයිතිකමකියන්නා—ඇල්. ඩී. ගුරුසිංහ.

| | | | | | |
|---|---|---|---|---|---|
| 4039 | ඇලඋඩවිලකරතුර | පානවැලිවිටියේ පදිංචි මාකාවිටගමගේ ජෝහානිස් | කුරුඳු | 0 0 35 | 40 |
| | | | වැවිල්ල | — — | 1 |

සිතියම 10,211. ගම—උඩලමත්ත. අයිතිකමකියන්නා—රජසන්තක.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | ගොහමුලෙවිලකරතුර | උඩලමත්තේ පදිංචි උඩමත්තගමගේ දියස් | පතන | 0 3 33 | 45 |

සිතියම 10,641. ගම—හැම්මැලිය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | විලේගොඩකන්ද | කුඹල්වැල්ලේ පදිංචි ජී. සී. බෙන්ජමින් | හේන | 0 0 25 | 80 |

සිතියම 10,644. ගම—පානවැලිවිටිය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | අටහවුලේහේන | පානවැලිවිටියේ පදිංචි ඇම්. ජී. ජෝහානිස් | බැද්ද | 3 1 15 | 45 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඒ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වෙනුව.

**No. 1,241, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 27වෙනි දිනවූ බදාදා දවල් 12ටත් කනිසමට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බුත්තල පලාතේ බදුළු දිස්ත්‍රික්කේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

අත්තිම සිතියම 172. ගම—බුත්තල බුත්තල වැදිරටකෝරලේ මුප්පනේ. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 55හ*b* | බලනමුල්ලේහේන .. | මුප්පනේ ආර්. ඇම්. සිරිවන්තේ .. | කෙහෙල්ගහක් සහ දූනට කවුරුවක් නැතුව අත්හැරදාපු ගෙයක් තිබේ .. | 3 2 18 |

බදු කොන්දේසි.

(*a*) තක්සේරු මුදල වන අක්කරයකට රුපියල් 1ක 'පිරිමියම්' මෙන් ලාබ මුදල පිට අවුරුද්දකට රුපියල් 8 ගණනේ ඉඩම 50ක් අවුරුද්දකට බදුදෙනු ලැබේ.

(*b*) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*c*) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තක කියා පල කරණු ලැබේ.

(*d*) නැවතීම පිණිස ගෙවල් ගොඩනැගීමට අවසරය දෙනුලැබේ.

(*e*) ආණ්ඩුවේ කාරණවකට ඉඩම උවමනාකලොත් 'පිරිමියම්' මෙන් ලාබ මුදල් පමණක් දී ඉඩම ආණ්ඩුවට ගනු ලැබේ.

(*f*) බද්ද ඉවරවූවිට ඉඩමේ තිබෙන ගොඩනැගිලි සහ පලතුරුවල වටිනාකම දෙන්නේ නැත.

(*g*) බදුදෙන අයගෙ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කෙරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම ගැන වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 3වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්ග.

---

**No. 1,242, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 28වෙනි දිනවූ බ්‍රහස්පතින්දා දවල් දොළහෙ කනිසමට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ උඩුකිඳ අඹවිනි පලාතේ පිහිටා තිබෙන බිම්කැබලි 5ක්.

ගම—උඩුකිඳ අඹවිනිපලාතකෝරලේ මිරිහවත්ත. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3 | රටලගොල්ලේපතන .. | ආර්. ගේව්හවුස් මහත්මයා .. | පතන .. | 0 2 35 |
| 5*a* | එම .. | එම .. | එම .. | 0 0 27 |
| 1*a* | බලගොටඇල්ල සහ රටලගොල්ලේපතන | එම .. | එම .. | 21 3 29 |
| 1*d* | රටලගොල්ලේපතන .. | එම .. | එම .. | 11 3 5 |
| 1*f* | එම .. | එම .. | එම .. | 21 0 33 |

බදු කොන්දේසි.

(*a*) තක්සේරු මුදලවන රුපියල් 150ක 'පිරිමියම්' මෙන් ලාබ මුදලපිට අවුරුද්දකට අක්කරයකට රුපියල් 2ක ගණනේ සදාකාලිකේට බදු දෙනු ලැබේ.

(*b*) අවුරුදුපතා පලමුවෙනි හයඅවුරුද්දේ බදු මුදල මුළු ගණනෙන් තුනෙන් කොටසක්වේ.

(*c*) ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*d*) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පලකරනුලැබේ.

(*e*) තේ වැවීම පිණිස උවමනාකරණ ගොඩනැගිලි හැදීමට පමණක් අවසර දෙනුලැබේ.

(*f*) තේ පමණක් මෙම ඉඩම්වල වැවිය යුතුයි.

(*g*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුලතදී හැම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුලතදී වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දුව ඉෂ්ටනොකලොත් ඉඩමෙහි වවා තිබෙන කොටස හැර අනිකුත් ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*h*) අවුරුදු 30කට වරක් බදු මුදල අළුත්වැඩියාකරණුලැබේ. බදුමුදල වැඩිවෙන ක්‍රමයනම් ප්‍රථම අවුරුදු 30කට ගෙවුවාවූ බදු මුදලෙන් බාගයකට වැඩිනොවේ.

(*i*) බදු දෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කිරීමටවත් බාරදීමට හෝ ලියා දීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කෙරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැන වැඩිදුර කරුණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ ජනවාරි මස 3වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්ග.

---

**No. 4,482, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ පෙබරවාරි මස 16වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 11ට මදවච්චියේදී බදුදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය පලාතේ නුවරගම් කොඨාසයේ කඩවත්කෝරලේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 573. ගම—කිරිගොල්ලෑව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 6 | අඹගහවත්ත .. | .. ආණ්ඩුව .. | .. වත්ත | .. 1 1 8 |

මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1917ක්වූ දෙසැම්බර් මස 27වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්ග.

**No. 4,483, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ පෙබරවාරි මස 22වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 11ට රත්නපුරයේදී බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවර කලාවිය පලාතේ නුවරගම් කොඨාසයේ විලච්චියකෝරළේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 734. ගම—දුනුමඩලාව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 24 | අක්කරවෙල | පිඩිරල වෙල්විදානෙගේ සහ කිරිහාමිගේ මල්හාමිගේ වගාව | වී | 0 3 31 |

ලංකාමැනීමේ මුල් සිතියම 649. ගම—රත්නපුරය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 28 | දිවුල්වැවවෙල | ආණ්ඩුව, රත්නපුරයේ පදිංචි අප්පුහාමි විදානේ සහ තවත් අයවළුන්ගේ වගාව | වී සහ හේන | 2 1 26 |
| 32 | එම | ආණ්ඩුව, රත්නපුරයේ පදිංචි වන්නිහාමි කෝරාලගේ වගාව | එම | 1 2 38 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 29වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඒ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම්.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මාබෝදලේ ඉස්කෝල ගෙදරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම් :—

සිතියම 16,591. ගම—මාබෝදලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 1 | කෝන්ගහවත්ත | පොල්වගාවක් | ඩී. ඒ. ආර්. විජේවර්දන | 0 1 36·5 |
| 2 | එම | එම | ඩී. ජේ. ආර්. විජේවර්‍ධන | 0 3 30·4 |
| 3 | අඹගහවත්ත | එම | එම | 0 0 1·3 |
| 4 | එම | වගාවක් නැත | එම | 0 0 0·5 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ පෙබ්‍රවාරි මස 4වෙනි දින දවල් 12යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 29වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:—පොල්ඹයපාලම සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියම 10,723. ගම—කතළුවේ මෝදර මෙගොඩහ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 1 | ගල්පඩුරඅද්දරවත්ත | ගෙයි කොටසක් | දොන තුසානා වික්‍රමනායක සහ තවත් අය | 0 0 0·4 |
| 2 | එම | වත්ත | එම | 0 0 9·2 |
| 3 | එම | එම | ජී. එච්. අප්පුබබා | 0 0 15 |
| 4 | කලකටතිබෙනගොඩනැගිල්ල | තැබෑරුමේ කොටසක් | එම | 0 0 1 |
| 5 | ගොඩැල්ලවත්ත | වත්ත | ජී. ඩබ්ලිව්. බිසෝ සිල්වා සහ ඇල්. එච්. බස්තියන් සිල්වා | 0 0 7·6 |
| 6 | එම | | (රජසන්තක) ජී. ඩබ්ලිව්. බිසෝ සිල්වා සහ තවත් අය ආණ්ඩුවෙන් අල්ලාගන තිබෙන | 0 0 1·2 |
| | ගම—කතළුව බස්නාහිර. | | | |
| 7 | පොල්ඹයමෝදරවත්ත | වත්ත | ජී. ඒ. ගුනරත්න උන්නැහේගේ උරුමක්කාරයෝ සහ තවත් අය | 0 1 20 |
| 8 | අම්බලම | අම්බලම | ටී. එච්. කොන්තේහාමි | 0 0 1 |
| 9 | පොල්ඹයමෝදරවත්ත | වත්ත | ජී. ඒ. ගුනරත්න උන්නැහේගේ උරුමක්කාරයෝ සහ තවත් අය | 0 0 2·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 28වෙනි දින පස්වරු 2යේ කනිසමට අහන්ගම ගම්සභාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 21වෙනි
දින ගාල්ලේ කච්චේරියේදීය.

ආර් බී. හැලින්ස්,
දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— රත්නපුරේ සිට ඔපනායක් දක්වා යන රේල්පාර කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

සිතියම 200. ගම—උතුරු හුනුවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන. අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 7 | හුනුවල රබර්වත්ත | .. අවුරුදු 11යේ රබර් | .. හුනුවල (පැල්මඩුල්ල) රබර් සමාගම .. | 0 | 0 | 17¾ |
| 8 | අව්විත්ඇල්ලෙහේන | .. ලන්ද | .. එම .. | 0 | 1 | 2¼ |
| 9 | හුනුවල රබර්වත්ත | .. අවුරුදු 11යේ රබර් | .. එම .. | 0 | 0 | 26½ |
| 10 | අතුඅරවෙකුඹුරෙදෙනිය | .. දෙනිය | .. ඩබ්ලිව්. ඇම්. මුදියන්සේ .. | 0 | 1 | 3½ |
| 11 | අව්විගේවත්තේහේන | .. ලන්ද | .. එම .. | 0 | 0 | 30 |
| 12 | හුනුවල රබර්වත්ත | .. අවුරුදු 11යේ රබර් | .. හුනුවල (පැල්මඩුල්ල) රබර් සමාගම .. | 1 | 1 | 30 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ ජනවාරි මස 28වෙනි දින පස්වරු 2කේ කාලයමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑ බව මෙයින් දැනගත යුතුයි.

තවද මෙම බිම්කට්ටි සහ මෙම දැන්වීමේ අඩංගුකරන්නේ ආණ්ඩුව විසින් ඒවාට යම් උරුමවාසිකමක් කීමට කාරණ පෙනී ගියොත් එසේ උරුමවාසිකම් කීමට ඉඩ තිබාගනය.

වර්‍ෂ 1917ක්වූ දෙසැම්බර් මස 29වෙනි
දින රත්නපුරේ කච්චේරියේදීය.

බී. කොන්ස්ටන්ටයින්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.